2020 මාර්තු 26

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,

ගරු. අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා,

අධිකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ටී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා,

නීතිඥ සංගමයේ සභාපති කාලිංග ඉන්දතිස්ස මහතා,

**පිටපත්:**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු බී.පී. අළුවිහාරේ, අධිකරණ සේවා කොමිෂන් සභාව,

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු. කේ. සිසිර ජේ. ද ආබෲ, අධිකරණ සේවා කොමිෂන් සභාව,

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය දීපිකා උඩගම,**

ශ්‍රී ලංකා නීතිපති දප්පුල ද ලිවේරා මහතා,

ශ්‍රී ලංකා ජාතික පොලිස් කොමිසම,

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් එච්. එස්. සෝමරත්න මහතා,

ගරු. පවිත්‍රා වන්නිආරච්චි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය,

## <u>බන්ධනාගාරවල COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා සිරකරුවන් නිදහස් කිරීම</u>

බන්ධනාගාර තුළ COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා ඉතාමත් වැදගත්වන, සිරකරුවන් නිදහස්කිරීම සහ බන්ධනාගාරවල තදබදය සමනයකිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට කමිටුවක් පත් කිරීම පිළිබඳ නිවේදනය අපි ඉතා සාදරයෙන් පිළිගන්නෙමු.

අවම සනීපාරක්ෂක හා සෞඛ්‍ය පහසුකම් තිබෙන බන්ධනාගාරවල තදබදය වැඩිවීමෙන් ඒවා COVID-19 පැතිරීමට තදින් ගොදුරු විය හැකිය. බන්ධනාගාරවල දී සිරකරුවන්ට ජලය සහ සබන් නිදහසේ ලබා ගත නොහැකි බැවින්, සිරකරුවන්ට සමාජ දුරස්ථභාවය සහ සබන් යොදා අත් සේදීම වැනි පොදු වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වේ. තවද, කාර්ය මණ්ඩලය පිටතට යාම හා නැවත පැමිණීම සිදුවන නිසා, බන්ධනාගාර වසා දැමීමට ද නොහැකිය. COVID-19 ආසාදන පිළිබඳව සිරකරුවන්ගේ සහ බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ ඇති බිය සමනය කිරීම වෙනුවෙන් තදබදය සමනය මෙන්ම වෙනත් පියවරයන් ද වැදගත් වේ. එවැනි භීතීන් නිසා බන්ධනාගාර කිහිපයක නොසන්සුන්තාවයන් ඇති වී ඇති අතර අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ දී ඇති වූ වෙඩි තැබීම් හේතුවෙන් මරණ හා තුවාල ද සිදුවිය. ඉන්දියාව, කොලොම්බියාව සහ ඉතාලිය වැනි වෙනත් රටවල බන්ධනාගාරවල COVID-19 ආශ්‍රිතව

නොසන්සුන්තාවයන් හා මරණ සිදුවී ඇති අතර, ඒ අනුව පෙනීයන පරිදි ආසාදනය පැතිරීයාමට පමණක් නොව, නොසන්සුන්තාවය සහ ප්‍රචණ්ඩත්වය සඳහා ද බන්ධනාගාර කේන්ද්‍රස්ථානයක් බවට පත්විය හැකිය.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ජනගහනයෙන් 50% කට වඩා වැඩි පිරිසක් රිමාන්ඩ් සිරකරුවන් බවත්, වරදකරුවන් වූ සිරකරුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් දඩ මුදල් ගෙවීම පැහැර හැර ඇති අය බවත් අපි දනිමු. තවද, ඇප ලබාදියහැකි සුළු වැරදි සඳහා ඇප ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සහ ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි වීම මෙන්ම නඩු විභාග ආරම්භ කිරීමට හා තීන්දුව ලබාදීමට දීර්ඝ කාලයක් බලා සිටීම ද බන්ධනාගාර තදබදයට හේතු වී තිබේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛනවලින් පෙනෙන පරිදි, දැනට පවතින “නිවාස නිවාඩු” සහ “බලපත්‍ර මත මුදාහැරීමේ යෝජනා ක්‍රමය”වැනි යෝජනා ක්‍රම හොඳින් ක්‍රියාත්මක වී ඇති අතර එබැවින් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන වර්තමාන නිලධාරිවාදී ප්‍රමාදයන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ.

2020 මාර්තු 16 වන දින සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුව (CPRP) විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ බන්ධනාගාර ආඥා පනත මත පදනම්ව ගත හැකි නිශ්චිත පියවර කිහිපයක් යෝජනා කරමින් ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යවරයා සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටියේ COVID-19 පැතිරීම වැළැක්වීම වෙනුවෙන් බන්ධනාගාරවල තදබදය සමනය කිරීම සඳහා සිරකරුවන් නිදහස් කිරීම පිළිබඳව සලකා බලන ලෙසයි. [1] ඔබගේ විමසීම්වල දී මේවා සලකා බලනු ඇතැයි අප විසින් බලාපොරොත්තු වන අතර, 2020 මාර්තු 26 වන අද දින පැවැත්වීමට නියමිත රැස්වීමට පෙර සිරකරුවන් නිදහස් කිරීම සඳහා පුළුල් නිර්ණායකයන් වර්ධනය කිරීම වෙනුවෙන් අමතර යෝජනා කිහිපයක් බෙදා ගැනීමට අපි කැමැත්තෙමු. **විශේෂයෙන්, අප විසින් ඉල්ලා සිටින්නේ, මාරාන්තික හෝ බරපතල රෝගාබාධවලින් පෙළෙන අය, වැඩිහිටියන් සහ මව්වරුන් සමඟ සිරගෙදර ජීවත් වන දරුවන් වැනි වැඩි අවදානමට ලක්විය හැකි අය පිළිබඳව ඔබගේ විමසා බැලීම තුළ දී සැලකිල්ලට ගන්නා ලෙසයි.**

වර්තමාන සන්දර්භය තුළ, අප විසින් ඉල්ලා සිටින්නේ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සහ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර තරුණ වැරදිකරුවන් ලෙස රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින පුද්ගලයින් සහ ගංගොඩවිල, මෙත්සෙවනෙහි රඳවාගෙන සිටින කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන් සමාලෝචනය කර නිදහස් කිරීම සිදුකරන ලෙසයි.

[1] https://twitter.com/rukitweets/status/1241403633012551680

බන්ධනාගාර තදබදය අවම කිරීම සහ COVID-19 පැතිරීම වැළැක්වීම වෙනුවෙන් පහත දක්වා ඇති ඇප ලබා දීම් සම්බන්ධයෙන් සලකා බලා ක්‍රියාත්මක කරන ලෙස අපි ගරු අගවිනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් අධිකරණ සේවා කොමිසමෙන් ඉල්ලා සිටින්නෙමු.

පවත්නා ක්‍රියාමාර්ග මෙන්ම අදාළ හා සුදුසු අවස්ථාවන් හි දී, වරදේ බරපතලකම හා ස්වභාවය සැලකිල්ලට ගෙන, විශේෂ අධිකරණ නඩු විභාග, පරිපාලන සමාලෝචන සහ ජනාධිපති සමාව ආදී වශයෙන් වූ පුළුල් හා පරිපූර්ණ ප්‍රවේශයක් අප විසින් ඉල්ලා සිටින්නෙමු. මෙම ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නැංවීමේ දී, විනිවිදභාවය සඳහා, නිදහස් කළ යුතු සිරකරුවන් තක්සේරු කිරීම සඳහා භාවිතා කරන නිර්ණායකයන් සහ එසේ මුදා හරින ලද එක් එක් කාණ්ඩයේ සිරකරුවන් සංඛ්‍යාව ප්‍රසිද්ධියට පත් කරන ලෙස ද අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

**1. ක්ෂණික ක්‍රියාමාර්ග**

<u>පොලිස් ස්ථානවල සිටින රැඳවියන්</u>

1. අත්‍යාවශ්‍ය නම් මිස පොලිස් ස්ථානවල පුද්ගලයින් රඳවා තබා ගැනීමෙන් වැළකීම.
2. හැකි තරම් දෙනා පොලිස් ඇප මත නිදහස් කිරීම.

**පහත දැක්වෙන කාණ්ඩවලට අයත් පුද්ගලයින් නිදහස් කිරීම:**

*<u>රිමාන්ඩ් සිරකරුවන්</u>*

අධිකරණය:

3. ඇප කොන්දේසි සපුරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රිමාන්ඩ් භාරයේ පසුවන අය සඳහා ඇප කොන්දේසි සමාලෝචනය කර වෙනස් කිරීම සහ ඇප මත මුදා හැරීම.
4. ඇප ලැබෙන, සුළු හා අපරාධ නොවන වැරදි සඳහා රිමාන්ඩ් කරනු ලැබූ අය සඳහා, විශේෂයෙන් ප්‍රමාණවත් නෛතික නියෝජනයක් නොමැති අය සඳහා ඇප ලබා දීම.
5. පසුගිය සතියේ සිට උසාවි කටයුතු සීමාකිරීම හේතුවෙන් ඔවුන්ගේ නඩු කල් දමා ඇති, ඇප ඉල්ලීමට / වරද පිළිගැනීමට සහ දඩ මුදලක් ගෙවීමට නොහැකි වූ අය ඇප මත මුදා හැරීම.

*<u>වරදකරුවන් වූ සිරකරුවන්</u>*

6. දඩ මුදල් ගෙවීමට ඇති නොහැකියාව හේතුවෙන් වැරදිකරුවන් වූ අයට සමාව දී නිදහස් කිරීම.
7. මාස හයකට අඩු සිර දඬුවමක් නියම කර ඇති අයව කලින් හා කොන්දේසි විරහිතව නිදහස් කිරීම.
8. මාස හයකට වඩා අඩු සිර දඬුවමක් ඉතිරිව සිටින අයව කලින් හා කොන්දේසි විරහිතව නිදහස් කිරීම.

9. සුදුසුකම් ලත් අය නිවාස නිවාඩු සහ බලපත්‍ර මත නිදහස් කිරීම.

**<u>මිරිහානේ ආගමන රැඳවුම් මධ්‍යස්ථානය (*IDC*)</u>**

නිදහස් කිරීම:

10. UNHCR හි අයදුම්පත්/අභියාචනා විභාග වෙමින් පවතින සරණාගතයින් සහ සරණාගතභාවය අයදුම් කරන්නන් සහ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංක්‍රමණ අයදුම්පත් විභාග වෙමින් පවතින්නන්.
11. දීර්ඝ කාලයක් තිස්සේ රඳවාගෙන සිටින අය. මෙම අවස්ථාවෙහි දී, මෙම පුද්ගලයින්ට ප්‍රජාව තුළ නවාතැන් ලබා ගැනීමට හැකියාවක් නොමැති අතර, ඔවුන්ට සුදුසු නවාතැන් පහසුකම් සැපයීම.

2. **කෙටි හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග**

12. වරදෙහි ස්වභාවය සහ බරපතලකම සැලකිල්ලට ගනිමින් අධිකරණය ඇප මත මුදා හැරීම සඳහා සමාලෝචනය කර සලකා බැලීම:

   a. අධිචෝදනා නොමැතිව වසර ගණනාවක් රිමාන්ඩ් කරනු ලැබූ පුද්ගලයන් සහ වසර ගණනාවක් තිස්සේ නඩු විභාග වෙමින් පවතින පුද්ගලයින්; සහ
   b. අභියාචනා විභාග වෙමින් පවතින අය.

13. වයස අවුරුදු 5 ට අඩු දරුවන් සිටින බන්ධනාගාරවල ජීවත්වන කාන්තාවන් නිදහස් කිරීම.
14. අදාළවන අවස්ථාවල දී, අවුරුදු 2 ට අඩු දඬුවම් ලබා ඇති අය ප්‍රජා පාදක නිවැරදි කිරීමේ නියෝග භාවිතාකොට නිදහස් කළ යුතුය.
15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ රඳවා සිටින රැඳවියන්ට ඇප ලබා දීම සම්බන්ධයෙන් වූ තීන්දු කඩිනම් කිරීමට නීතිපති විසින් කටයුතු කිරීම.

පවුල්වල අය සහ වෙනත් අය විසින් සිරගෙවල්වලට යාම නැවැත්වීම සැලකිල්ලට ගනිමින් අපි යෝජනා කරන්නේ:

- සිරකරුවන්හට තම පවුල් සමඟ සන්නිවේදනය පහසු කිරීම සහ සිරකරුවන්, පවුල් සහ බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ මානසික ආතතිය, කම්පනය සහ බිය සමනය කිරීම වෙනුවෙන් සිරකරුවන්ට අධීක්ෂණයට යටත් විකල්ප සන්නිවේදන පද්ධති (උදා: දුරකථන) සැපයීම. සමහර ක්‍රියාමාර්ග දැනටමත් යෝජනා කර ඇති අතර ඒවා පොදු අවකාශය තුළ පවතී .[2]
- මීට අමතරව, හමුවීම් නැවැත්වීම හේතුවෙන් සිරකරුවන්ට සබන්, දන්තාලේප සහ සනීපාරක්ෂක තුවා වැනි පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා ප්‍රවේශය නොලැබෙන හෙයින්, සිරකරුවන්

[2] https://twitter.com/ambikasat/status/1241619318225297408

සඳහා ඒවා මිලදී ගැනීමට හා ලබා දීමට මූල්‍ය සම්පත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිමු.

COVID-19 සන්දර්භය තුළ සිරකරුවන් නිදහස් කිරීම දැන් සිදුවෙමින් පවතින අතර ඉරානය, බහරේනය සහ ඇමරිකා එක්සත් ජනපදය ආදී වශයෙන් ලොව පුරා එය සැලසුම් කර තිබේ. මේ සතිය මුල දී ඉන්දියාවේ සහ පාකිස්තානයේ අධිකරණ මේ සම්බන්ධයෙන් තීරණාත්මක මැදිහත්වීමක් කර තිබේ. විශේෂයෙන්ම, පසුගිය සඳුදා දිල්ලි මහාධිකරණයේ නියෝගය අනුව "වහාම, වඩාත් සුදුසු පරිදි දින 2 ක් ඇතුළත"බන්ධනාගාර තදබදය සමනය කිරීමට යෝජනා කර ඇති බව අප විසින් පෙන්වා දෙන අතරම, මෙම පසුවන සෑම මිනිත්තුවකදී ම මුදා හැරීම ප්‍රමාද වන විට අපගේ බන්ධනාගාරවල COVID-19 පැතිරීම කෙරෙහි ඇතිවන ඉහළ යන අවදානම හඳුනා ගන්නා ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. මහජන යහපත උදෙසා, මෙම සතිය අවසාන වන විට නිර්ණායකයන් අවසන් කර නිදහස් කිරීම් ක්‍රියාත්මක කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

නිදහස් කිරීමට අමතරව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර බන්ධනාගාරවල ඇති වන ආසාදන නිරීක්ෂණය කිරීම හා හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම මෙන්ම රෝග ලක්ෂණ ඇති අයට නිරෝධායනය හා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ ක්‍රියාමාර්ග ද සකස් කරන ලෙස අප විසින් නිර්දේශ කරන්නෙමු. මීට අමතරව, COVID-19 වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිරකරුවන් සහ බන්ධනාගාර කාර්ය මණ්ඩලය සඳහා පැවැත්විය යුතු අතර, පසුව, විශේෂයෙන් බන්ධනාගාර වෛද්‍ය මධ්‍යස්ථාන/රෝහල්වල සේවය කරන අයට අත්‍යවශ්‍ය පුද්ගලික ආරක්ෂක උපාංග ලබා දිය යුතුය.

වැඩි විස්තර සඳහා කරුණාකර 077-2817164 / 071-4453890 දුරකථන අංක මගින් නීතිඥ සේනක පෙරේරා මහතා අමතන්න.

ස්තූතියි,

විශ්වාසී,